අතුරුගිරියේ මිලේනියම් සිටි සංකීර්ණයේ ව්‍යාපාරිකයෙකුගේ නිවෙසකින් රන් භාණ්ඩ සොරකම් කළ බවට වන චෝදනාවක් යටතේ ගෘහ සේවිකාවක් අත්අඩංගුවට පත්වීමේ පුවත දිනමිණ සහ ලංකාදීප පුවත් වාර්තාවන් (සැප්තැම්බර් 15, 2023) තුළ දැක්වී තිබුණේ මෙසේය.

දිනමිණ -"මිලේනියම් සිටි නිවෙසකින් රන් බඩු ඉස්සූ මෙහෙකාරිය රිමාන්ඩ්" (පුවත් අන්තර්ගතයේ ඇය "ගෘහ සේවිකාවක" ලෙසින් හඳුන්වා ඇත.)

ලංකාදීප - "ලක්ෂ 10 ක රන් සොරකමට ගෘහ සේවිකාව අත්අඩංගුවට" (පුවත් අන්තර්ගතයේ ඇය "ගෘහ සේවිකාවක" ලෙසින් හඳුන්වා ඇත.)

ඔබ සිතන ලෙසට,

සේවානියුක්ත-සේවායෝජක වැනි වර්තමාන වඩාත් වෘත්තිමය සම්බන්ධතාවයන් තුළ "මෙහෙකාරිය" යන යෙදුම කෙතරම් උචිත ද? එසේ නොමැති නම් "ගෘහ සේවිකාව" වැනි යෙදුමක් භාවිතය වඩාත් වෘත්තිය සම්බන්ධතාවයක් නොහඟවන්නේ ද?

ඒ අනුව ඔබ තෝරාගන්නා වාර්තාකරණය කුමක්ද?

